JMC vLearning
"your virtual learning partner"

# LKAS 10 : වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

## AAT අදියර III
## FAR - මූල්‍ය වාර්තාකරණය


සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

# LKAS 10 – Events after the Reporting Date

JMC Learning
"your virtual learning partner"




JMC vLearning
“your virtual learning partner”




JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ 01

චතුර සමාගමේ ගිණුම් වර්ෂය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. මූල්‍ය වාර්තා කට්ටලය 2020 පෙබරවාරි 02 දින වන විට පිළියෙළ විය. අධ්‍යක්ෂ මණ්ඩලය 2020 මාර්තු 03 වන දින මූල්‍ය වාර්තා කට්ටලය අනුමත කළ අතර වාර්ෂික මහ සභා රැස්වීම පැවැත් වූයේ 2020 ජූනි 02 වන දිනය.

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසු පහත සිදුවීම සිදු වූ අතර, ඒවා ගැලපිය යුතු ද? නොගැලපිය යුතුද? යන්න සඳහන් කරන්න.

1. මූල්‍ය තත්ව ප්‍රකාශන දිනය වන විට සිටි පහත ණයගැතියන් බුන්වත් වී ඇත

- රංජිත් සමාගම 2020 පෙබරවාරි 28 දින (රු.මිලියන 10)
- සාමා සමාගම 2020 මාර්තු 04 දින ( රු.මිලියන 20)
- මනෝ සමාගම 2020 ජනවාරි 02 දින චතුර සමාගමෙන් රු-මිලියන 1 ක් වූ භාණ්ඩ ණයට ගත් අතර 2020 මාර්තු 01 දින සිය බුන්වත්භාවය ප්‍රකාශයට පත් කරන ලදි

2. 2020 ජනවාරි 02 දින චතුර සමාගම සිය හිස් වැසුම් නිෂ්පාදන අංශය වැසීමට තීරණය කළ අතර එහි වූ යන්ත්‍ර සියල්ල පෙබරවාරි මාසය තුළ විකුණා දමන ලදි. විකුණුම් අලාභය රු මිලියන 02.

3. 2020 පෙබරවාරි 02 දින අභ්‍යන්තර විගණන පරීක්ෂාවේදි චතුර සමාගමේ මුදල් අයකැමි විසින් 2019 දෙසැම්බර් මස සිදු කළ මූල්‍ය වංචාවක් හසු විය. එහි වටිනාකම රු. 500,000 කි.

4. 2020 අප්‍රේල් 29 වන දින හටගත් හදිසි ජල ගැලීමෙන් චතුර සමාගමේ රත්නපුර ගබඩාව සම්පූර්ණයෙන් විනාශ වූ අතර සිදු වූ හානිය රු. මිලියන 2කි.
පහත තොරතුරු තොග අයිතම සම්බන්ධයෙන් අදාළ වේ

| විකුණූ දිනය | අයිතම වර්ගය | ඒකක පිරිවැය | සත්‍ය විකුණුම් මිල | සත්‍ය විකුණුම් පිරිවැය | විකුණූ අයිතම ගණන |
|---|---|---|---|---|---|
| 2020-01-02 | X | 800 | 1000 | 100 | 10000 |
| 2020-01-15 | Y | 500 | 550 | 70 | 20000 |
| 2020-03-04 | Z | 1200 | 1300 | 120 | 50000 |

.

JMCVLearning
"your virtual learning partner

5. චතුර සමාගම 2020 මාර්තු 01 දින තම තරඟකරුවෙකු වූ කුමාර සමාගම අත්පත් කර ගන්නා ලදී

6. චතුර සමාගමේ සේවකයෙකු සමාගමට විරුද්ධව වන්දි ඉල්ලා නඩුවක් පවරා තිබුණි. වාර්තාකරණ දිනය වන විටත් උසාවියේ විභාග වූ මෙම නඩුවේ තීන්දුව 2020 පෙබරවාරි 25 වන දින ප්‍රකාශයට පත්කළ අතර ඒ අනුව සමාගමට රු. මිලියනයක් සේවකයාට ගෙවීමට සිදු විය

7. චතුර සමාගම 2019 වර්ෂය සඳහා පහත ලාභාංශ 2020 මාර්තු 01 දින ප්‍රකාශයට පත් කරන ලදී

- වරණීය කොටස් ලාභාංශය කොටසකට රු.1/-
- සාමාන්‍ය කොටස් අවසන් ලාභාංශය කොටසකට රු.2/-

8. චතුර සමාගම සමාගම 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා එකතුව රු. 785,000ක් වාර්ෂිකව ගෙවන නිෂ්පාදන ප්‍රසාද මුදල ගෙවීමට 2020.02.10 දින තීරණය කරන ලදී